# ධර්මදූත විද්‍යාලය - බදුල්ල
## ප්‍රථම වාර පරීක්ෂණය - 2017
## ඉතිහාසය.

8 ශ්‍රේණිය                                                                කාලය -: පැය 02යි.

### 1 කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ශ්‍රී ලංකාවේ මහා වැව් තැනීම ආරම්භකයා ලෙස සැලකන්නේ,
1. මහසෙන් රජතුමා
11. වසභ
111. පණ්ඩුකාභය
1V. මහා පරාක්‍රමබාහු

(2) මහා වැව් ඉදිකිරීමට හේතු වූයේ කුමන්ද?
1. රජවරුන්ගේ යුතුකමක් නිසාය.
11. වියළි කලාපයේ වැඩිවන ජනගහන වේගයට සාපේක්ෂව ආහාර නිපද වීම වැඩි කිරිම නිසාය.
111. සෑම කෘෂි වගාවකටම ජලය අවශ්‍ය නිසාය.
1V. වාරි තාක්ෂණය ගැන මනා අවබෝධයක් තිබූ නිසාය.

(3) වසභ රජු ඉදිකළ වැව් ප්‍රමාණය වන්නේ,
1. 12කි.   11. 18කි.   111. 11කි.   1V. 10කි.

(4) වැවක ඇති වන අධි පීඩන ජලය වැව් බැම්ම හරහා ඇළ මාර්ගය වෙතට ගැනීමට ඉදි කර ඇති ස්ථානය වන්නේ,
1. බිසෝ කොටුව   11. පිටවාන   111. සොරොව්ව   1V. පිටවාන

(5) දිවයිනේ මුල් වරට උයනක් සෑදූ රජු ලෙස හඳුන්වන්නේ,
1. මුටසීව රජතුමාය
11. ධාතුසේන රජතුමාය.
111. දේවානම් පියතිස්ස රජතුමාය
1V. මහසෙන් රජතුමාය

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(6) පද්ම ස්වර උයන..............................................තනවා ඇත.
(ගෝඨාභය රජු / කූටකණ්ණ තිස්ස )

(7) අභයගිර විහාර භූමියේ පොකුණු ...................................... පමණ තනවා තිබේ.
( 40ක් / 65ක් )

(8) ධාතුසේන රජු කලා වැවේ සිට ..............................ජලය ගෙනයෑමට යෝධ ඇළ කරවීය.
( තිසා වැව / මින්නේරි වැව )

- පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(9) වැව් 18ක් කරවූ රජතුමා නම් කරන්න.

.............................................................................................................................

(10) වැව් සෑදීම නිසා මහසෙන් රජු හැඳින්වූ විරුදනාමය කුමක්ද?

.............................................................................................................................

(11) ලංකාවේ අලංකාරය සඳහා ඉදිකළ පොකුණු 02ක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

(12) මහමේඝනා උයන සඟ සතුකර පූජා කල රජු කවුද?

.............................................................................................................................

(13) අතීතයේ ආළිසාර ලෙස හැඳින්වූ ඇළ කුමක්ද?

.............................................................................................................................

(14) රජ රට වාරි ශිෂ්ටාචාරය බිඳවැටීමට ආසන්නම හේතුව කුමක්ද?

.............................................................................................................................

- පහත A තීරුවේ ප්‍රකාශයට ගැළපෙන වාක්‍ය කණ්ඩය B තීරුවෙන් තෝරා යා කරන්න

| | A | B |
|---|---|---|
| (15) | 1 වන අග්ගබෝධි රජතුමාය | * ආර්.එල්.බ්‍රෝහියර් |
| (16) | ලක්දිව පුරාතන වාරි මාර්ග වාරි මාර්ග කෘතිය රචනා කළේ | * රන්මසු උයන |
| (17) | සිගිරිය තුළ උද්‍යාන සොයා ගන්නා ලද්දේ | * එම්.සී.ජී.බෙල් සහා සෙනරත් පරණවිතාන |
| (18) | තිසා වැව් ඉවුරේ ශාන්ත පරිසරයට සමීපව ඇති උයන | * මිනිපේ ඇළ |
| (19) | මිහිඳු හිමි ධර්මය දේශනා කළ උයන | * සිගිරි උද්‍යානය |
| (20) | දකුණු ආසියාවේ ඇති පැරණිතම උද්‍යානය | * ජෝති වනය |

( ලකුණු 2x20=40)

## 11 කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05ට පිළිතුරු සපයන්න.

A 

B 

C 

(01) පහත A,B,C ඇසුරින් දක්වා ඇති ප්‍රශ්න වලට දී ඇති පින්තූර ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

A. 1. A පින්තූරයේ දැක්වෙන පොකුණ නම් කරන්න.
11. එය පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේද?
111. මෙය කරවූ රජතුමා කවුද?

B 1. B පින්තූරයේ දැක්වෙන ස්ථානය කුමක්ද?
11. එම ස්ථානය රාජධානිය කරගත් රජු කවුද?
111. මෙය ඉදිකළේ කුමන සියවස තුළදී ද?

C. 1. C පින්තූරයේ දැක්වෙන ස්ථානය කුමක්ද?
1. මෙම පොකුණ ඉදිකර ඇත්තේ කාගේ ප්‍රයෝජනය සඳහාද?
11. මෙය පිහිටා ඇත්තේ කුමන ස්ථානයකද? ( A,B,C ලකුණු 5x3=15)

D. සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

- මින්නේරි වැව
- කලා ඔය
- යෝධ ඇල
- පොලොන්නරුව
- පරාක්‍රමබාහු සමුද්‍රය (ලකුණු 05යි.)

(02) 1. ජල තාක්ෂණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

11. අතීත ජනයා තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ජලය ආශ්‍රිතව කළ නිර්මාණ මොනවාද?

111.මහා වැව් ඉදි කිරිමට පෙර ඉදිකර තිබු කුඩා වැව් මොනවාද? (ලකුණු 10යි )

(03) 1. වැවක් තනවා ඇත්තේ කෙසේද?

11. වැවක ප්‍රධාන අංග මොනවාද?

111.විශාල වැව් ඉදි කිරීමෙන් ලාංකිකයන් ලබා ගත් ප්‍රයෝජන මොනවාද? (ලකුණු 10යි)

(04) 1. ඇළ මාර්ග තැනීමේ මූලික අවශ්‍යතා 02ක් ලියන්න.

11. පහත සඳහන් ඇළ මාර්ග සෑදූ රජවරු කවුරුන්ද?

- ඇළ හැර ඇළ
- තල වතු ඇළ
- යෝධ ඇළ

111. ඇළක් තැනවීමේදී අතීතයේ වාරි ශිල්පීන් මුහුණ දුන් අභියෝග 02ක් සඳහන් කරන්න.

(ලකුණු 10යි)

(05) 1. පොකුණු වර්ග මොනවාද?

11. පොකුණු සෑදූ විවිධ හැඩ වර්ග මොනවාද?

111.වියළි කලාපයේ පොකුණු මනා සැලැස්මකට ඉදිකළ බවට ඔබ උගත් කරුණු 02ක් යටතේ පැහැදිලි කරන්න. ( ලකුණු 10යි)

(06) 1. ලංකාවේ අලංකාර අතීත ජල උද්‍යාන මොනවා ද?

11. සීගිරි ජල උද්‍යානය කුමන වර්ෂයකට අයත්වේ ද?

111.සීගිරි ජල උද්‍යානයේ සුවිශේෂී අංග මොනවා ද? ( ලකුණු 10යි)